# ශ්‍රී ලංකාවේ ළමා අපචාර වර්ධනය වීම කෙරෙහි බලපෑ සමාජ පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

## (හික්කඩුව හා රම්මුදුගල සඟනික කළ පාසල් ඇසුරිනි)

ඒ.ඩබ්.කේ වසන්තා ගුණසිංහ
සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ලෝකයේ බොහෝ රටවලට බලපානු ලබන එසේම ලාංකීය සමාජයේ වැඩි ප්‍රවණතාවයක් දක්වන සමාජ ප්‍රශ්නයක් ලෙස ළමා අපචාරීන්ගේ වර්ධනය හඳුනාගත හැකිය. සමාජ සම්මත චර්යාවන්ගෙන් පරිබාහිර ක්‍රියාකාරකම් කෙරෙහි හැඹුරු වීමට දරුවන් දක්වන කැමැත්තත් ඒ කෙරෙහි බලපානු ලබන හේතූන් සොයා බැලීමත් පර්යේෂණය මඟින් සිදු කෙරුණි.

ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස මෙලොව එළිය දකින දරුවා සමාජීය සත්වයෙකු බවට පත් කරනුයේ සමාජානුයෝජනය නම් වූ පුළුල් සමාජ ක්‍රියාවලිය තුළිනි.

දරුවෙකුගේ සමාජ චර්යාව තීරණය කිරීමේදී පවුල නමැති සංස්ථාව වැදගත් වන ආකාරය විශේෂිතයි. මෙහිදී මවගේ කාර්යභාරය විශේෂ සහිතය. මාතෘ විහිනතාවය හෙවත් මව් සෙනෙහස අහිමි වීම දරුවන් හීන පෞරුෂ ලක්ෂණයන්ගෙන් යුක්ත වීමටත් ආක්‍රමණශීලී හා ආවේගකාරී ලක්ෂණයන්ගෙන් යුක්ත වීමටත් හේතු වේ. පියා හා සහෝදරයන්ද මෙබඳුම දායකත්වයක් සැපයීම වැදගත් වන්නේ පූර්ණ මානසිකත්වයක් ඇති වීමට මෙන්ම පොදු හැඟීම්, සමානාත්මතාවය, එකමුතුකම බෙදා ගැනීම ආදිය හුරුවන්නේ මූලික වශයෙන්ම පවුල තුළින් වීම නිසයි.

දරුවෙකුගේ සමාජානුයෝජන ක්‍රියාවලියේදී ද්විතියික සමාජානුයෝජන කාරක වන පාසල, සම වයස් කණ්ඩායම්, උප සංස්කෘතීන්ද, ජන මාධ්‍යයන් වැනි ඒකකයන්ද වැදගත් වේ. නායකත්වය, ජය පැරදුම, විඳ දරා ගැනීම, නීති රීති පිළිගැනීම, අනුන්ගේ දීම, ඉවසීම වැනි කරුණු අත් විඳිමින් ඉගෙන ගන්නේ ද්විතියික සමාජානුයෝජන කාරකයන්ගෙනි.

දරුවන් නිසිලෙස සමාජ ගත වූ විට සමාජ සාරධර්ම අගනාකම් පිළිපදිමින් සංස්කෘතිය රැක ගැනීමත් ඉදිරි පරපුරට දායාද කිරීමක්ද කරනු ලබයි. නමුත් දරුවන් වැරදි ලෙස සමාජ ගත වීම හෙවත් දුස් සමාජානුයෝජනය නිසා සමාජ විරෝධී චර්යාවන්ගෙන් යුක්තදරුවන් බිහිවනු ලබයි. මෙය පෞද්ගලික මෙන්ම ජාතික වශයෙන්ද ගැටළුකාරී තත්වයකි. ළමයින් වැඩිහිටියන් සේ අපරාධ සඳහා යොමු නොවුනත් පෞද්ගලිකව තමන්ට සිදු වන හානිය තුළ තිබෙන අනියත ප්‍රතිඵලය වන්නේ සමාජ විරෝධී පුද්ගලයෙකු බිහිවීමයි. අකීකරුකමින් ආරම්භ වන චර්යාව නිවසින් පැන යාම, පාසලින් බැහැර වීම, ඇයාලේ යෑම, සොරකමට හෝ ගණිකා වෘත්තියට පුරුදු වීම, මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට පුරුදු වීම, ත්‍රස්තවාදී ක්‍රියා, ස්ත්‍රී දූෂකයන් වීම, මිනී මරුවන් වීම දක්වා පවා චර්යාමය වෙනස්කම් වලට බඳුන් වේ.

අපචාර සඳහා යොමු වූ දරුවන්ට දෙමාපියන්ගේ රැකවරණය හා සෙනෙහස ලබා දීම අත්‍යවශ්‍ය අංගය වන අතර විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කරවීම දෙවැනි පියවර සේ සැලකිය හැකිය. ඊට අමතරව දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය තුළදී සමාජානුයෝජන කාරකයන්ගේ වැදගත්කම අවබෝධ කරලීමත් දරුවන් වෙනුවෙන් මෙන්ම දෙමාපියන් සඳහාද සම්මත චර්යාවන්, සමාජ ධර්මතා සම්බන්ධව දැනුවත් කිරීම ප්‍රදේශයේ සමාජ සංවිධාන මඟින් කිරීමත් ඒ සඳහා ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය අනුග්‍රහය සහිත සංවිධාන සම්බන්ධ කරගත හැකි වේ.